# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 6 ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය     කාලය : පැය 2

### I කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මේ සඳහා ලකුණු 40කි.**
- **1 - 5 ප්‍රශ්නවලට වඩාත් ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

1) පාසලේ ඉතිහාසය දැන ගැනීමට ලොග් පොත මෙන් ම ................................................ ගෙන් ද ලබා ගන්නා තොරතුරු වැදගත් ය. (ශිෂ්‍යාවන් / දෙමාපියන් / විශ්‍රාමික විදුහල්පතිවරු)

2) ඔබේ දක්ෂතා ................................................ පෙන්වීමට හැකි වීමෙන් ඔබේ දියුණුව සලසා ගත හැක. (නිරන්තරයෙන් / අවශ්‍ය වූ විට / අවස්ථානුකූලව)

3) ආවේගශීලීබව හා ................................................ ඔබේ අභියෝග ජය ගැනීමට බාධාවක් වේ. (නිර්මාණශීලී බව / අලස බව / විද්‍යුත් මාධ්‍ය භාවිතය)

4) පාසලක සංවිධාන ව්‍යුහය ගත්විට ආදි ශිෂ්‍ය සංගමය හා ................................................ කමිටුවට ද වැදගත් තැනක් හිමි වේ. (පරිසර / පාසල් සංවර්ධන / සුභසාධක)

5) ඔබගේ ජීවදත්ත පත්‍රිකාවේ ඇතුළත් වන්නේ ................................................ (පියා පිළිබඳ / ඔබ පිළිබඳ / විදුහල්පති පිළිබඳ ) තොරතුරුය.

- **නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

6) ශ්‍රී ලංකාවේ පරිපාලන බෙදීම අනුව කුඩාම පරිපාලන ඒකකය වන්නේ,
   1. දිස්ත්‍රික්කය
   2. පළාත
   3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
   4. ග්‍රාම නිලධාරී කොට්ඨාශය

7) බස්නාහිර පළාතට අයත් දිස්ත්‍රික්ක ගණන,
   1. දෙකකි
   2. තුනකි
   3. හතරකි
   4. පහකි

8) උප්පැන්න සහතික හා මරණ සහතික නිකුත් කිරීම, ග්‍රාම සේවා සහතික අනුමත කිරීම සිදු කරන්නේ,
   1. ග්‍රාම නිලධාරී කාර්යාලය
   2. කලාප අධ්‍යාපන කාර්යාලය
   3. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
   4. ප්‍රාදේශීය සභා කාර්යාලය

9) තම දුර්වලතා අවම කර ගැනීමට කළ හැක්කේ,
   1. තම දුර්වලතා හඳුනා ගැනීම
   2. අනුන්ගේ දුර්වලතා හඳුනා ගැනීම
   3. තම දුර්වලතා වසා ගැනීම
   4. අනුන්ගේ දුර්වලතා පෙන්වා දීම

10) සැලසුම්සහගතකරණය හා සංවිධානය නිසා,
   1. ගැටලු උග්‍ර වේ
   2. කාලය නාස්ති වේ
   3. සිතේ පීඩාකාරී බව අඩු වේ
   4. සම්පත් අපතේ යයි

- **11 - 15 තෙක් ප්‍රශ්නවලට හරි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

11) ගුරු ඇගයීම් කටයුතු විදුහල්පති විසින් සිදු කරයි. ( )

12) සෑම පුද්ගලයෙකුටම අනන්‍යතාවයක් නැත. ( )

13) ඔබගේ දක්ෂතා සමාජ දියුණුවට වැදගත් නොවේ. ( )

14) පාසල අනාගතයේ ඉටු කර ගැනීමට බලාපොරොත්තු වන අරමුණු 'මෙහෙවර' ප්‍රකාශයෙන් දැක්වේ. ( )

15) ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක විසිපහකි. ( )

- **16 - 20 තෙක් ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර සොයා යා කරන්න.**

| | |
|---|---|
| 16) රාජ්‍ය ආයතනයකි. | වැටි බැඳීම |
| 17) නිවාස ඉදිකිරීමට අවශ්‍ය වේ. | රට සංවර්ධනය |
| 18) මානව සම්පත පුහුණු වේ. | වෙළඳාම |
| 19) පාංශු සංරක්ෂණ ක්‍රමයකි. | භූමිය |
| 20) ආර්ථික කටයුත්තකි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |

## II කොටස

- **ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

1)
1. ඔබේ පාසලේ ආදර්ශ පාඨය ලියන්න. (ල. 3)
2. පාසල් ලාංඡනය භාවිතා කරන අවස්ථා 4 ලියන්න. (ල. 4)
3. පාසලක ළමයි සම්බන්ධව පවතින පොදු නීති 5ක් ලියන්න. (ල. 5)

2)
1. පාසල් ගීතයෙන් ඉටුවන මෙහෙවර කරුණු 3කින් ප්‍රකාශ කරන්න. (ල. 3)
2. ගුරුවරු වෙනුවෙන් ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් 4 ලියන්න. (ල. 4)
3. පාසල තුළ ඔබේ හැකියා, දක්ෂතා වර්ධනය සඳහා රජයෙන් සපයා ඇති පහසුකම් 5ක් ලියන්න. (ල. 5)

3)
1. මධ්‍යම පළාතට අයත් දිස්ත්‍රික්ක 3 ක් ලියන්න. (ල. 3)
2. සාමූහිකව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන 4ක් ලියන්න. (ල. 4)
3. භෞතික සම්පත් සංරක්ෂණය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග 5ක් ලියන්න. (ල. 5)

4)
1. මානව සම්පත් 3ක් ලියන්න. (ල. 3)
2. එම මානව සම්පත්වලින් ලැබෙන ප්‍රයෝජන 4 ලියන්න. (ල. 4)
3. මානව සම්පත් විධිමත්ව පුහුණු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන 5ක් ලියන්න. (ල. 5)

5) පහත වගුව සම්පූර්ණ කරන්න.

| පළාත | දිස්ත්‍රික්කය |
|---|---|
| නැගෙනහිර | ........................................ |
| ........................................ | පුත්තලම |
| ඌව | ........................................ |
| ........................................ | ගම්පහ |
| දකුණ | ........................................ |
| ........................................ | අනුරාධපුරය |

එකකට ලකුණු 2 බැගින්

6)

1. ගොවි සමිතියකින් ඉටු කරන සේවා 3ක් ලියන්න. (ල. 3)
2. සිද්ධස්ථාන මඟින් ඉටුවන සේවා 4ක් ලියන්න. (ල. 4)
3. අපට සේවා සපයන ආයතනවලින් ඉටුවිය යුතු යුතුකම් 5ක් ලියන්න. (ල. 5)

7)

1. වාතය / සුළඟ මඟින් ලබාගන්නා ප්‍රයෝජන 3ක් ලියන්න. (ල. 3)
2. ඛණිජ සම්පත් වර්ග 2ක් නම් කර ඒවා යොදා ගෙන කරන නිෂ්පාදන වෙන වෙනම ලියන්න. (ල. 4)
3. උතුරු පළාතට අයත් දිස්ත්‍රික්ක 5 නම් කරන්න. (ල. 5)